ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 පෙබරවාරි 06 සඳුදා
04 වෙළුම - 15 කලාප
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



අති උතුම් වම්මැනුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි

අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමි

# කොළඹ අගරදගුරු පදවියට නව සහයක රදගුරු හිමි දෙනමක්

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# කොළඹ අගරදගුරු වසමට සහයක රදගුරු වංශාවලියක් තිබේ

## ආදරණීය දුවේ පුතේ...

2012 පෙබරවාරි 11 වන දිනය කොළඹ අගරදගුරු පදවියට ඉතාමත්ම වැදගත් දිනයක් බවට පත්වෙනවා. ඒ ඔබ කවුරුත් දන්නා පරිදි නව රදගුරු හිමිපාණන් දෙදෙනෙකු පත් වීම සම්බන්ධයෙනුයි. අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් හා අතිගරු මැක්ස්වල් සිල්වා හිමිපාණන් සහයක රදගුරු දෙනමක් වශයෙන් එදින කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව් මැදුරේදී අභිෂේක කරනු ලබනවා.

ආදර දුවේ, පුතේ

දැන් අපි බලමු, රදගුරු පදවියකට සහයක රදගුරු වරුන් පත් කිරීමේ පරමාර්ථය කුමක් ද? කියලා කතෝලික සභාවේ පවතින නීති සංග්‍රහයට අනුව සහයක රදගුරුතුමෙකු පත් කරන්නේ නාමධාරි රදගුරු හිමි කෙනෙක් ලෙසයි. මෙම නාමධාරි රදගුරු වසමේ නාමය වර්තමානයේ බල නොපවතින වසමක් හැටියට නම් වෙනවා. විශේෂයෙන්ම බටහිර රටවල පැවති නමුත් අද බල නොපවතින මෙම රදගුරු වසමෙහි නාමයන් එලෙස පත්වන සහයක රදගුරු හිමිවරුන් යටතට පත් කරනව. ඒ නිසා සහයක රදගුරු හිමිවරුන් යටතට නාමිකව පමණයි රදගුරු වසමක් පැවරෙන්නේ. නමුත් තමන් සේවය කරන රදගුරු පදවියේ ක්‍රියාකාරි සහයක රදගුරු වරයෙක් හැටියට තම කාර්යයභාරය මුදු හැරිය යුතුයි.

දැන් කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු හිමිපාණන් හැටියට කටයුතු කරන අති උතුම් මේරියස් පීරිස් හිමිපාණන් යටතට නාමධාරීව පැවරි ඇති රදගුරු වසම වන්නේ ''ටකරාටාහි'' රදගුරු වසමයි. නමුත් එතුමාණන් ක්‍රියාශිලිව තම දූත සේවාව විහිද යවන්නේ කොළඹ අගරදගුරු පදවිය තුළයි. එහි සහයක රදගුරු හිමිපාණන් වශයෙනුයි.

ආදර දුවේ පුතේ,

විශේෂයෙන්ම කාර්යය බහුල රදගුරු පදවි වලට සහයක රදගුරු තුමෙකුගේ සහය අත්‍යවශ්‍යයයි. එඩේරික දූත කාර්යය, පදවි පරිපාලනය හා විශේෂිත සක්‍රමේන්තු දනයට සහයක රදගුරු තුමන්ලාගේ සහය අත්‍යවශය වන්නේ වඩාත් පුළුල් ලෙස එඩේරික කාර්යය භාරය ගිහි ජනතාව අතර විධිමත් කරන්නටයි. මෙහිදි අප අවබෝධ කර ගන්නට අවශ්‍ය වෙන තව කාරණාවක් තිබෙනවා. ඒ තමයි සහයක රදගුරුතුමන්ලා කොටස් දෙකකින් සමන්විත වන බව. එහිදී පළමු කොටසට අයත් වන රදගුරු තුමන්ලා විශේෂ බලතල සහිත රදගුරු තුමන්ලා වන අතර දෙවන කොටස බලතල රහිත රදගුරු තුමන්ලා වශයෙන් හඳුන්වන්නට පිළිවන්.

මෙහිදී පළමු කොටසේ සහයක රදගුරු තුමන්ලා පදවියේ එඬේරිය දූත මෙහෙවර හා පරිපාලනයේ දී ශ්‍රේෂ්ඨ රදගුරු තුමාට සහය විය යුතු අතර, පදවියේ ශ්‍රේෂ්ඨ රදගුරු තුමා පදවියෙන් බැහැර වන අවස්ථා වලදී එතුමාගේ ස්ථානය ලබාගන්නවා. එහිදී සහයක රදගුරු තුමා නිතැතින්ම අනුනායක හෝ කලාපීය නාහිමි තත්ත්වයට පත්වෙනු ලබනවා. දෙවන කොටසට අයත් වන සහයක රදගුරු තුමන්ලා රදගුරු වසමේ අවශ්‍යතා අනුව බලතල හිමි කර ගන්නා අතර කලාපීය නාහිමි තත්ත්වයේ සිට ක්‍රියා කරනු ලබයි. නමුත් මෙහිදී විශේෂ වන්නේ මෙම සහයක රදගුරු තුමන්ලා පදවි පරිපාලක රදගුරු තුමා හා සමඟ සමීප සහයෝගයෙන් ක්‍රියා කල යුතු බව හා එඬේරිය දූත මෙහෙවර හි සුවිශේෂි කාරණා වලදී පරිපාලක රදගුරු හිමි සහයක රදගුරුගුමාගේ උපදේශකත්වය තුළ ක්‍රීයා කළ යුතු බව අවබෝධ කර ගැනීමයි.

ආදර දුවේ පුතේ,

රදගුරු පදවියක ඇතිවන විශේෂ කතිකා, ධර්මානුශාසනා හා සැසිවාරයන් තුළ නිරන්තරයෙන්ම සහයක රදගුරු තුමන් පදවියේ පරිපාලක රදගුරු තුමා සමඟ සහයෝගයෙන් හා සුහදත්වයෙන් යුතුව ක්‍රියා කල යුතු වෙනවා. එලෙසම රදගුරු වසමේ මීසම් බැහැ දැකීම, විශේෂිත ප්‍රසාද නිධානයන් දනය කිරීම හා සංවත්සර ජුබිලි මංගල්‍යයන් සඳහා සහභාගි වීමට සහයක රදගුරු තුමන් බැඳී සිටිනවා.

කොළඹ අගරදගුරු වසම මුල්කොට සහයක රදගුරු තුමන්ලාගේ දිර්ඝ ඉතිහාසයක් තිබෙනවා.

★ ක්‍රි.ව. 1962 දෙසැම්බර් 27 වන දින ''ටාකාපේ'' නාමධාරී රදගුරු වසමේ රදගුරු හිමිපාණන් ලෙසත් කොළඹ අගරදගුරු පදවියේ ප්‍රථම සහයක රදගුරු හිමිපාණන් ලෙසත් අති උතුම් ඇන්තනි ද සේරම් හිමිපාණන් අබිසෙස් ලබනවා.

★ ක්‍රි.ව. 1965 ජූලි මස 24 වන දින අති උතුම් ෆැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් කොළඹ සහයක රදගුරු හිමි වශයෙන් හා ''ඔලිවාහි'' නාමධාරි රදගුරු හිමි ලෙසද පත්වීම ලබනව.

★ ක්‍රි.ව. 1968 ජූනි 23 වන දින කොළඹ අගරදගුරු වසම සහයක රදගුරු හිමිවරුන් දෙදෙනෙක් පත්වීම් ලබනවා. ''ඉගිල්ගිලි'' හි නාමධාරි රදගුරු හිමි ලෙස පත්වීම් ලද අති උතුම් එඩ්මන්ඩ් ජේ ප්‍රනාන්දු හිමිපාණන් හා ''මුලියා'' හි නාමධාරි රදගුරු හිමිපාණන් ලෙස පත්වීම් ලද අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් ඒ පත්වීම ලද සහයක රදගුරු හිමි දෙනමයි.

★ ක්‍රි.ව. 1991 ජූනි මස 17 වන දින ''කබර්සුසි'' හි නාමධාරී රදගුරු හිමිපාණන් ලෙස අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් කොළඹ සහයක රදගුරු තත්ත්වයට පත් වෙනු ලබනවා.

★ ක්‍රි.ව. 2001 වසරේ අගරදගුරු පදවියේ සහයක රදගුරු තනතුරට පත්වුයේ අති උතුම් මේරියස් පීරිස් හිමිපාණන්ය. එතුමාණන් ''ටාකාරාටා'' හි නාමාධාරි රදගුරු තුමන් ලෙසද පත් විම ලැබුවා.

නවතම සහයක රදගුරු හිමි දෙනම වන්නේ අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හා අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ය. අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන් ''ඕර්ටාහි'' නාමධාරි රදගුරු තුමන් සේ පත් විම් ලබා ඇති අතර අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිම්පණන් ''ලෙසිනා'' හි නාමධාරී රදගුරු තුමන් සේ පත්වීම් ලබා ඇත. තවත් මේ ගැන කියවා පුංචි ඔබ විස්තර දැන ගන්න.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




# සිතුවිල්ල

✍ කේ. ජේ. ප්‍රනාන්දු

මුළු ශාලාවම නිශ්ශබ්ද තාවයක් උසුලයි. ශාලාවෙහි ළමුන් කල්පනා ලොවේ නිමග්න වී ඇත. වරෙක ඇතැම් ළමයෙකු පුටුව පසෙකට කරමින් නැගී සිටියි. එවිටම ගුරු මහතකු පැමිණ කරුණු අසා ළමයා වාඩි කරවයි.

මම දොළොසේවන ප්‍රශ්නය දෙසට ඇස යොමු කළෙමි. එහි ඇත්තේ අසල්වාසින්ට උපකාර කරන්නේ කෙසේ ද කියායි. මම මේ ප්‍රශ්නය තුළ ගැඹුරුට ගිලි සිටියෙමි.

මගේ මනස ප්‍රශ්න පත්‍රයේ අහලකවත් නැත. මගේ මනස ඇත්තේ ඊයේ සිදු වු සිද්ධිය වෙතය. ජේම්ස් අයියා අපේ ගෙවල් අසල සරු සාර කඩයක් දමාගෙන සැපට ජීවත් වන්නෙකි. ඔහු තරමක් අපේ නෑයෙක් වෙයි.

අපේ තාත්තා මිය ගොස් ඊයෙට වර්ෂ තුනකි. අපට එදින කෑමට කිසිවක් නැත. අම්මා එදින මෝලට නොගොස් නැවතුනේ තරමක් අසනීප ගතියක් නිසා ය. නමුත් අම්මා මා පාන්දරින් අවදි කෙරෙව්වා ය.

‘‘පුතා මම අද වැඩට යන්නේ නෑ’’යි කිවාය. ‘‘ඇයි අම්මා’’ මම ඇසුවෙමි. ‘මට අද සනීප මදි පුතා’යි අම්මා කීවාය. අපගේ දෙබස් කෙළවර වන්නටත් කලින් පොඩි නංගී අවදි වුවාය. මම වහාම ගොස් නංගී කැඳවාගෙන ආවෙමි. ඒ වන විටත් අම්මා තේ සුදනම් කර අවසාන ය. අනතුරුව නංගී ඇතුළු අප දෙදෙනා තේ බී පිලට වී සිටියෙමු. මෙසේ ටික වෙලාවක් සිටි අතර ජේම්ස් අයියා කඩය ඇරීමට ඉක්මන් ගමනින් පාරේ යමින් සිටියේ ය.

පැයකින් පමණ පසු අම්මා මට කතා කර ‘‘පුතේ උඹ ගිහිල්ලා ජේම්ස් මාමගෙන් පාන් ගෙඩියක් ඉල්ලන් වරෙන්’’ යයි කීවාය. මමද ඇගේ අණට කීකරු වී කබල් බැනියම ගෙන උඩුකය ආවරණය කර ගෙන ඉක්මන් ගමනින් කඩය දෙසට පියවර මැන්නෙමි. මෙසේ යන අතරමඟ මට කල්පනා වුයේ මගේ පියා ගැනය. ඔහු සිටින්නට අද අපට මෙ-වැනි තත්ත්වයක් උද්ගත නොවනු ඇත. එසේ නම් මම සහ නංගී දෙමහල්ලන්ගේ සුරතලුන් වෙමු. නමුත් අද අපට එවැනි ප්‍රීතියක් නැත.

මෙසේ කල්පනාවෙන් මම මාමාගේ කඩයට ගොඩ වුනෙමි. මා දුටු මාමා. ‘ආ.... බං.... මොකද අද උදෙන්ම යැ’ යි ඇසීය.

මම ඉතා බයාදු ලෙස ‘‘මාමේ අම්මා කිව්වා සල්ලි පස්සෙ දෙන්නම් කියලා පාන් ගෙඩියක් ඉල්ලන් එන්න කිලායා.’’ එවිටම අහසින් හෙන එන්නාක් මෙන් මාමා මා වෙත කඩා පැන්නේ ය.

‘‘තොපි හිතන් ඉන්නවාද තොපිට මෙහෙ බඩු පුරවා ඉන්නවා කියලා. අප්පා නැති එවුන්ට මොන බඩුද’’ යි ගිගුරුවේය. මගේ දෑස කඳුලින් පිරිලා අවට අපැහැදිලි වනවාත් සමඟම හැඬුම නවතා ගෙන, මඟට පැන ගෙදර දිව්වෙමි. අවුත් සිදු වු සියල්ලම අම්මාට විස්තරවකීවෙමි.

එවිට අම්මා ගේ දෙකොපුල් ඔස්සේ කඳුළු බිඳු දෙකක් රූරා විත් පොලොව සිප ගත්තේ ය. එවිට මගේ හිතේ මාමා ගැන විස්තර කළ නොහැකි කෝපයක් හට ගැනුනි. එවිට අම්මා කතා කර ‘‘පුතේ මාමා ඔහොම කරණ බව මම මීට පෙර දන්නවා ය’’ යී තතනමින්’, කීවාය.

ගුරුවරයකු උස්හඬින්, ප්‍රශ්න පත්‍රයට තව විනාඩි දහයක් පමණ ඇති බව හඬ නගා කියයි. මම කල්පනා ලොවින් මත්වුනෙමි. මම වහාම අවසන් ප්‍රශ්නයට පිළිතුරු ලියා ඩෙස්කය මත හිස රුවා ගත්තෙමි.

# සහෝදරත්වයේ දෑත් දිගුකරමින් ළක්‍රිවියෙන් උතුරට නෑගමනක්





සියළු භේදවලින් තොරව නව ලොවක් තනන්නට කුඩා දරුවන් දිරි ගන්වන ආදරණීය ළ.ක්‍රි.වී. අම්මා උතුරේ තම දරුවන් හා එක්ව තෛපොංගල් උත්සවය සැමරීමටත්, යාපනයේ තම දුවා දරුවන්ගේ සැපදුක් බලන්නටත් කොළඹින් පිටත්වුණේ ළ.ක්‍රි.වී අම්මාගේ "සාම පාලම" වැඩසටහනේ තවත් පියවරක් තබමිනි.

කවදත් ළ.ක්‍රි.වී අම්මාට ආදරය කරන පුංචි පැංචියන් දකුණෙන් පැමිණි තම යහළු යෙහෙළියන් වටේ රොකවුනේ පිරී ඉතිරී ගිය සතුටිනි. උතුරේ සහ දකුණේ අය ළ.ක්‍රි.වී අම්මාගේ පහස වින්දේ සැබෑ වීරයෙකු මෙන් තම ජීවිත ජයගන්නා සැටි නැටුම් රැගුම් මිශ්‍රව පැවති ළස්සන ක්‍රියාකාරකම් තුළිනි.

යාපනයේ සුන්දර මුහුදු වෙරළකට උරුමකම් කියන ''චාට්ටි'' නම් ප්‍රදේශයට අනුබද්ධිත ගම්මාන කිහිපයකම දූ දරුවනට ළ.ක්‍රි.වී අම්මාගේ පහස ලබා දීමට අපට හැක විය. උතුරු දකුණු දෑත් කිහිපයක් එක් වී සාදාගත් එම පොංගල් බතෙහි සාම සුවඳ විහිඳුනේ උතුරු බිමේ විතරක් නොව අප සැමගේ ද හදවත් වලත්ය. මෙහිදී අච්චුවේලි, සෙල්වනායග පුරම් යන ගම්වල ළමුනට ළ.ක්‍රි.වී අම්මාගේ ආදර කරුණාව හඳුන්වා දීමට ද අපට අවස්ථාවක් ලැබිණි. තවද ළක්‍රිවිය සමග අත්වැල් බැඳ සිටින උතුරේ " CPR " නම් වූ සාමය හා සමාදානය සඳහාවූ කේන්ද්‍රයේ තරුණ තරුණියන් අප හා සමග එක්ව උතුරු බිමේ ළ.ක්‍රි.වී ව්‍යාපාරයේ ව්‍යාප්තිය පිළිබඳව පැවැත්වූ විග්‍රහශීලී සාකච්ඡාව ඉතාමත් ඵලදායී විය. ළ.ක්‍රි.වී. ජාතික අධ්‍යක්ෂ ගරු ජෝ කුරේ පියතුමාන්ගේ අනුශාසනකත්වයෙන් මෙය සංවිධානය කෙරෙනි.

**එස්. ජීවදේවී**
**ළ.ක්‍රි.වී. ජාතික කාර්යාලය**

---

**මාසික සිතිවිල්ල**

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



සේයා.
සී.ආර්. ඩික්සන් ඇන්ටනි.

ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ

**මාසික සිතිවිල්ල** "ජනවාරි මාසය"

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08

## දේව මහිමය



ආදර දෙවිඳුනි
ඔබ තරම් බලවතෙක්
මම මෙතෙක්
නොදුටුවෙමි.
ඔබගේ නාමය ඇසෙද්දී
මගේ සිත පිනායයි
පියාණෙනි, නිරතුරු
මම ඔබ අමතන්නෙමි
ඔබට ප්‍රශංසා ගී
ගයන්නෙමි.

ප්‍රසාද් ජයවර්ධන
11 ශ්‍රේණිය
සා. පියෝ දහම් පාසල
අතුරුගිරිය



## පොඩි ෆාදර් ලියයි

ගරු නිරංජන් විජේරත්න
(සා. බෙ. නි.) පියතුමා

# ජේසු පුංචි ළමයින්ට හරිම ආදරෙයි !

ඉතින් ආදර දුවේ පුතේ කොහොමද ඒ අලුත් අවුරුද්ද. මම හිතනවා මේ වසර ඔයාලා හැමෝටම වරප්‍රසාදයෙන් පිරි වසරක් කියලා. ඔයාලා දන්නවාද ජේසු පුංචි ඔයාලට ගොඩක් ආදරෙයි කියලා පුරාණ ගිවිසුමේ දෙවියන් වහස්නසේගේ ආදරය අත්දැකපු ඔබ වගේම කුඩා ළමෙයක් ගැන ලස්සන කථාවක් තියෙනවා. ඒක තියෙන්නේ 1 සාමුවෙල් 3/1-10.



ඔන්න පුතේ, දුවේ එල්කානා සහ හාන්නා කියලා යුවලක් හිටියා මේ යුවලට හිටියා සාමුවෙල් කියලා කුඩා දරුවෙක්. මේ අම්මයි තාත්තයි සාමුවෙල් කුඩා කාලයේදීම පල්ලියේ පුජකතුමා වෙත ගෙන ගොස් ''පියාණෙනි මේ දරුවා හදා ගන්න. දෙවියන් වහන්සේ වෙත ඔහුව යොමු කරන්න කියලා. මේ මහළු පුජකයාගේ නම එලී. මේ කුඩා සාමුවෙලුත් එලී පුජකතුමා යටතේ දේව මාළිගාවේ නැවතිලා සේවය කළා. හරියට පුජා උදව් වෙන දරුවෙක් වගේ හුගාක් උදව් වුනා. පල්ලිය පිරිසිදු කරන්න, බඩු මුට්ටු නියම පිළිවෙලට තියන්න.

දවසක් පල්ලියේ නිදාගෙන ඉන්න කොට කුඩා සාමුවෙල්ට ඇහෙනවා ''සාමුවෙල්, සාමුවෙල් කියලා හඬගහනවා'' ඉක්මනට එලි පුජක තුමා ගගට ගිහින් ඇහුවා මට කතා කලාද කියලා දෙපාරක්ම මෙහෙම වුනා. පුජක තුමාට වැටහෙනවා දෙවියන් වහන්සේ කථා කරන බව ඊට පස්සේ කිව්වා ආයේ ඒ හඬ ඇහුනොත් ''ස්වාමිනි කථා කළ මැනව ඔබගේ දාසයා සවන් දි සිටියි කියා'' කියන්න කියලා. මෙලෙස සමිදාණන් වහන්සේ සාමුවෙල්ව දේව සේවයට තෝරා ගත්තා. ඔහු වැඩිහිටියෙක් වුනා. දෙවියන් වහන්සේටත් මිනිසුන්ටත් ප්‍රසන්න වුනා. ඊශ්‍රායෙල් ජනයාගේ නායකයා වුනා. රජවරුන්ට පවා උපදෙස් දෙන තත්වයට පැමිණියා. ආදර දරුවෙනි මේ කථාවෙන් ඔබේ ජීවිතයට පාඩම් කිහිපයක් ලබා ගන්න පුළුවන්. එම ආදරවෙන් අපි එකින් එක විග්‍රහ කරමින් අපේ ජීවිත වලට ආදේශ කර ගන්නට උත්සහ කරමු.

### 1. කීකරුකම :-

පුංචි සාමුවෙල් දෙවියන් වහන්සේටත් එලි පුජකතුමන්ටත් කීකරුව හිටියා. ඔබත් ආදර දෙමාපියන්ට, ගුරුවරුන්ට, පුජාප්‍රසාදිතුමන්ට, පැවදි සොයුරියන්ට පාසලේ නීතිරීති වලට, රටේ නීතියට කීකරු වෙන්න ඕනේ. අද ඔබ නීතිරීති වලට අනිත් අයට කීකරුව හිටියොත් පමණයි අනාදියේදී ඔබට අනිත් අයව පාලනය කරන්න නායකත්වය කරනට හැකියාව ලැබෙන්නේ.

### 2. හදවතින් ඉගෙන ගැනීම :-

කුඩා සාමුවෙල් එලි පුජකතුමා යටතේ හැමදෙයක් ගැනම හොදට ඉගෙනගත්තා වගේ ඔබත් හොදට ඉගෙන ගන්න ඕනේ. හැමදේටම කාලයත් පිළිවෙලත් තියෙනවා. පාසල් කාලය තියෙන්නේ ඉගෙන ගන්න. ප්‍රේම කරන්න නොවෙයි. බාලකාලේ, පාසල් කාලය ආයේ එන්නේ නෑ. සදාචාරය නීති රීති, අධ්‍යාපනය ඉගෙන ගත්තාට පස්සෙයි ප්‍රේමය ඉගෙන ගන්න ඕන. අර ලස්සන කවියක් තියෙනවා විභාගේ අත ළග අත පොත ළග, පොත හිත ළග කියලා හිත ආයෙත් පොත ළග තියෙන්න ඕනේ ආගම, දේවභය භක්තිය හදවතින් ඉගන ගන්න ඕන. ඒක අනිත් විෂයන් වගේ නොවේ නිතරම දහම් පාසල් එන්න ඕන. පල්ලියට ලං වෙන් ඕන.

### 3. යාච්ඤා කරන්න ඉගෙන ගන්න ඕන.

ආදර දරුවෙනි දවසට කිහිප වතාවක්ම දෙවියන් සිහිකරන්න ඕන. අද ළමයිට ඕනම සිංදුවක් එක පාරක් ඇහුවොත් කට පාඩම් නමුත් යාච්ඤා එහෙම නැහැ පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද ලබන කොටත් යාච්ඤා පාඩම් දෙනවා. අභිවෘදිආලේපය ලබන්න සුදානම් වෙන කොටත් එහෙමයි. ඒත් ඊට පස්සේ යාච්ඤා මතක නෑ. පාපොච්චාරණව කරන විදිහ දන්නේ නෑ යාච්ඤා ඉගෙන ගන්න උනන්දුවක් නෑ ජේසුනි මම ඔබට ආදරෙයි කියලා ඇයි පුංචි යාච්ඤාවක් කියන්න බැරි. අපි ජේසුට ආදරේ නම් ජේසු අපිට ඕන දෙයක් දෙනවා.

### 4. මිදි උයනට එන්න ඇරියුම් කරනවා :-

එදා සාමුවෙල්ට දෙවියන් වහන්සේ පුද්ගලිකව කතා කලා. එලෙස අද ඔබටත් කතා කරනවා. නමුත් ඔබ කන්වල ගැජමැටික් ගහගෙන නිසා ඇහෙන්නේ නැහැ දේව හඩ ඇහෙන්නේ නෑ අද දෙවියන් වහන්සේ ඔබට කෙලින් කතා කරලා කියන්නේ නැහැ ගයාන් ඔයා ස්වාමි කෙනෙක් වෙන්න සදුනි ඔයා සිස්ටර් කෙනෙක් වෙන්න කියලා. අනිත් අය මාර්ගයෙන් කතා කරන්නේ මීසමේ පියතුමා, කන්‍යා සොයුරියන්, ගුරුවර ගුරුවරියන් යහළුවන් දෙමාපියන් මාර්ගයෙන්, හැබැයි අපි හොදින් ඇහුම්කම් දීලා ඒ කැදවීම ස්ථිර වෙන්න යාච්ඤා කරන්න ඕන. කැදවීමට ආශාවක් තියන අය කියන්න ''ස්වාමිනි කතා කල මැනව ඔබගේ දරුවා සවන් දී සිටී කියා. හොඳ දරුවන් වෙන්න, ඔබට ජේසු පිහිටයි.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ගිවිසුම් සංකල්පය හා මොසෙස් ඇසුරින් ප්‍රශ්න කිහිපයක් විමසා බලමු !

01. ගිවිසුම් සම්ප්‍රදායේ ලක්‍ෂණ කවරේද ?

- දෙපාර්ශවයක් අතර බැඳීමකි
- දෙපාර්ශවයට පැවරෙන වගකීම් ඇත්තේ ය.
- ක්‍රියාත්මක වන්නේ අන්‍යෝන්‍ය විශ්වාසය මතය.
- අවශ්‍ය ආකාරයට සකස් කරගත් කොන්දේසි මතය.
- ප්‍රතිලාභ ඇත්තේ ය.
- ගිවිසුමේ ඇති කොන්දේසි / ප්‍රතිලාභ දෙපාර්ශවය අනුමත කළ යුතුය.

02. ශුද්ධවූ බයිබලයේ පළමු වන ගිවිසුම යන සංකල්පය සඳහන් වන්නේ, (2001- උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 03)

- නෝවා පිළිබඳ කථාවේ ය.

03. පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමක් ඇති කර ගත් පුද්ගලයින් වනුයේ, (1998 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 03)

- නෝවා, ආබ්‍රහම් සහ මෝසෙස් ය.

04. දෙවියන් වහන්සේ නෝවා සහ සියළු ජීවමාන සතුන් ඇති කරගත් ගිවිසුම සම්බන්ධයෙන් කුමක් පැවසූ සේක් ද?

- ''වළාකුළු අතර දේදුන්න පෙනෙන විට, මම එය දෙස බලන්නෙමි. එය දැක, මා හා මිහිපිට සියළු ජීවමාන සතුන් අතර පිහිටෙ වූ සදාතන ගිවිසුම සිහි කරන්නෙමි''(උත්පත්ති 9/16)

05. දෙවියන් වහන්සේ හා නෝවා අතර ගිවිසුමෙහි සංකේතය කුමක්ද?
- දේදුන්න

06. ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ පාරාවෝ රජු යටතේ කළ කර්මාන්ත කවරේද ?
- කුඹල් කර්මාන්තය
- කෙත්වල විවිධ කෘෂිකර්මාන්තය
- ගඩොල් කර්මාන්තය

07. මෝසස් දෙවියන් වහන්සේගේ මුහුණ නොබැලුවේ (2000 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 05)
- මරණයට ඇත බිය නිසාය.

08. දෙවියන් වහන්සේ මෝසෙස්ට කථා කල මුල්ම අවස්ථාවේ සඳහන් කළ පුද්ගලයින් තිදෙනා වන්නේ (1999 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 04)

- ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්

09. මෝසස් තම සෙනඟට මිසරයෙන් පිටවීමට පාරාවෝගෙන් අවසර ඉල්ලුවේ, (1999 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 05)

- දෙවියන් වහන්සේට වැඳුම් පිදුම් කරනු පිණිස යාමටය.

10. මිසරයේ සිදුවූ පීඩන තුළින් ප්‍රකාශ වූ (2001 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 05)

- යාවේ දෙවියන් වහන්සේ බලගතු බවය.

11. සීනායි ගිවිසුමේ පරමාර්ථය වුයේ, (2001 - උසස් පෙළ ක්‍රිස්තු ධර්මය : ප්‍රශ්න අංක 06)

- ජනතාව දෙවියන්ගේ සම්පත බවට පත්කිරීමය.

12. ඊශ්‍රායෙල් ජනතාවට නායකත්වය දුන් මෝසෙස්ගේ සහයට සමිඳාණන් වහන්සේ ලබාදුන් තැනැත්තා කවුද?

- ආරොන්

13. වසංගත දහය නම් කරන්න.

★ වතුර ලේ වීම
★ ගව සම්පත් වැනසීම
★ සන්'දුරු උවදුර
★ මැසි උවදුර
★ පළගැටි උවදුර
★ කිනිතුලු උවදුර
★ ගල් වර්ෂා
★ මැඩි උවදුර
★ ගඩු උවදුර
★ කුළුඳුලන් මැරීම

14. පුරාණ ගිවිසුමේ එන වහල් බවින් නිවහල් වීමේ හෙවත් නපුර පරදා යහපත ජයග්‍රහණය කිරීමේ සංකේතයක් නම් කරන්න.

- රතු මුහුදින් එතෙර වීම.

15. නික්මයාම ගමනේ දී ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේව අත් දුටු අවස්ථා නම් කරන්න.

★ රතු මුහුද තරණය
★ ගිනිටැඹ හා වලාටැඹ මග පෙන්වීම
★ ආහාර වශයෙන් මන්නා සහ වටුමස් ලැබීම
★ කාන්තාරයේදී ජලය ලැබීම
★ සීනායි ගිවිසුම හෙවත් දස පනත ලැබීම

**ඉදිරිපත් කිරීම
ගරු ඩෙමියන් පෙරේරා
පියතුමන් විසිනි.**

# තේවත්ත බැසිලිකා පුදබිම හැඩග

**පසුගිය සතිය හා සබැඳේ...**

### 07. ධාතුසේන රජු මුරුන්ඩි සේනා සමඟ පැමිණීම (ක්‍රි.ව. 458)



ලංකාවේ මෝරිය රාජ වංශයේ පළමුවන රජ වන ධාතුසේන රජ ඉන්දියානු රාජ්‍යයේ තමා සතු උරුමය තම සහෝදර සීලාතිස්සබෝධිට භාරදී තම සිහසුන රැකගැනීමට ( එවකට ලංකාව පාලනය කරමින් සිටි ක්ෂුද්‍ර පාරේන්ද්‍ර නමැති කලාබු රජුන් පරදවා රාජ්‍යය යළි සිය අතට ගන්නට) දකුණු ඉන්දියාවේ පුන්ද්‍රා ප්‍රදේශයෙන් නැව් 75 කින් මුරුන්ඩි භට සේනාවක් සමඟ ලංකාවට පැමිණියහ. මොවුන් බහුතරයක් කිතු බැතිමතුන්ය. මොවුන් සලාවටන හෙවත් හලාවතින් ගොඩබැස ඇත. සටනින් පසු සමහර ජන කොටස් මෙහි පදිංචි වූ බවට මූලාශ්‍ර ඇත. වෙළඳුන්, ධීවරයන් හා තොටුපළ ආශ්‍රිත රැකියාවන්හි යෙදුණු මුල් කිතුනු පිරිසට එක්වූ මේ සෙබළ පිරිස හලාවත අවට කිතුනු ගම්මානවලට මුල් පදනම් විය. මෙහි පැමිණි බහුතරයක් කිතුනුවන් බව සෙනරත් පරණවිතාන මහත්මා ඉතාමත් අවධාරණයෙන් සඳහන් කරයි. මොවුහු පර්සියාවෙන් පැමිණි කිතුනුවන්ගෙන් පෝෂණය වූ අය වෙත්.



### 08. මිගාර සෙනවිගේ පැමිණීම

පුරාවිද්‍යා කොමසාරිස් සෙනරත් පරණවිතාන ශූරීන් ලියා ඇති පරිදි අන්තර් ජාතික අභිමානය සඳහා ‘‘පර්වත රජා’’ වීමේ අදහසින් සීගිරිය රාජධානිය කරගෙන සිය පාලනය කළ ධාතුසේන රජුට විරුද්ධව සටන් කිරීමට ඉන්දියාවේ පල්ලව රජු එවූ සේනාවේ සෙන්පතියා වූයේ කිතුනු මිගාර සෙනවියා ය. ධාතුසේන රජුගේ පුත් කාශ්‍යප කුමරු එම හමුදාව පරදවා මිගාරව රජ වෙත ගෙන ආවේ ය. පසුව ඇතිකරගත් සාම ගිවිසුම නිසා මිගාර සෙනෙවි ධාතුසේන රජුගේ සාම ගිවිසුමකට එකඟව රජුගේ සේනාවේ අණ දෙන නිලධාරි තැන වශයෙන් බැඳුණේය.

### 09 . සංඝා කුමරිය මගින් දහම ලක් රජයේ



මිගාර සෙනවියාගේ බිරිඳ වන සංඝා කුමරියට තම දරු දෙදෙනාත් සමඟ ලංකාවට පැමිණීමට මාර්ගය පෑදුනි. සංඝා, කුමරිය දැඩි කිතුනු භක්තිකයෙකි. මිගාර සෙනවිගේ උත්සහය නිසා සීගිරියේ රාජධානිය තුළ දෙව් මැදුරක් තැනීමට රාජ්‍ය අනුග්‍රහය ලැබිණි. කාශ්‍යප රජ දවස සීගිරියේ දෙව්මැදුර අභිෂේක ජිනස්ස කරිස්ත්‍ය ප්‍රසාද ආරාමය නමින් හැඳින්වේ. අභිෂේක ජින යනු ක්‍රිස්තුන් වහන්සේ සඳහා භාවිතා කරන ලද බව සෙනරත් පරණවිතාන මහතා පවසා ඇත.

### 10. කාශ්‍යප යුගයේ වාණිජ දියුණුව කිතු දහමට රැකුලක්

අප දිවයිනේ බටහිර වෙරළේ කල්‍යාණිපට්ටන හෙවත් කැළණිය, උතුරු වෙරළේ බල්ලතීර්ත පටුන හෙවත් වල්ලිපුරම්, නැගෙනහිර වෙරළේ සමන්ත පටුන හෙවත්,



# න්වන ලෝකඩ මූර්ති



මඩකලපුව දිස්ත්‍රික්කයේ සමන්තුරේ යන තොටුපළ ආශ්‍රිත වාණිජකරණයේ වර්ධනය සඳහා විශාල වෙළෙඳ සැල්ද පිටතින් එන වෙළෙඳුන් සඳහා නවාතැන් ද, ආපන ශාලා ද, නෘත්‍ය ගීත රංගන ශාලා ද සෑදීමට රජ නියෝග කළේ ය. මේ වෙළෙඳාම සහ තොටුපොළ දියුණුවීම නිසා කිතුනු ජනාවාස බිහිවී දියුණු විය.

- ★ සීගිරි පර්වතය මත කුරුස ලාංඡනය තැබීම.
- ★ කුරුසිය ලකුණු ඇති කාසි සොයා ගැනීම.
- ★ මෙහි දෙව් මැදුරක් තිබීම.

## 11. ලංකාවේ පළමු කිතුනු රජු මුගලන් - ක්‍රි.ව. 500



කාශ්‍යප රජ දවස විප්‍රවාසීව සිටි මුගලන් කුමරා පෙරළා පැමිණීම. හෙතම ඉතා කෲර ලෙස කාශ්‍යප රජුගේ හිතවතුන් හා ඥාතීන් වදයට පත් කළ කුරිරු රජකු වීම. එවතුදු විප්‍රවාසී කාලවේදී කිතු දහම වැළැඳ ගැනීම - එබැවින් හෙතෙම ලංකවේ පළමු කිතුනු රජු ලෙස සැළැකිය හැකි  ය. තෙ වරක්ම සිය ඇදහීම වෙනස් කළ ද මිය යන්නේ කිතුනුවෙකු ලෙසිනි. එබැවින් ඔහු ලංකාවේ පළමු කිතුනු රජු වශයෙන් සැළකීමට සිදුවේ. මින් පසු කුමාරදස සහ ක්‍රිත්ති සේන යන කිතුනු රජවරු කෙටිකාලයක් රටේ රජ කළහ.

## 12. ආසියාවේ කිතුනු සම්බන්ධතා දියුණුව



සත්වැනි සියවසේ සිට අටවන සියවස දක්වා පෙරදි කිතුනු සභා විවිධ රටවලට අයත් සංස්කෘතීන් අනුව හැඩගැසීම, පෙරදිග කිතුනු සභාවන් තුළ විවිධත්වයක් දැකීමට හැකිවීම, කිතු දහමේ පණිවුඩය මුහුදු මාර්ග ඔස්සේ පැතිරීම. සේද මාර්ගය ඔස්සේ වෙළෙඳුන් යාම නිසා කිතු දහම ප්‍රචලිත වීම. නැව් මාර්ගයෙන් ඉන්දියාවටත් අට සහ නව වැනි සියවසරවල සංක්‍රමික කිතුනු පිරිස් පර්සියාවේ සිට ලංකාවටත් පැමිණීම. මෙම පිරිසේ පැමිණි නායකයා වුයේ රදගුරු තෝමස් තුමා ය. මොවුන් සමඟ තවත් රදගුරුවරු දෙදෙනෙක් පැමිණීම.

සබ්‍රිෂෝ - ක්‍රිස්තුන් වහන්සේගේ බලාපොරොත්තුව

දස්ඉෂෝ - ක්‍රිස්තුන් වහන්සේගේ දසයා

ඔවුන් දෙදෙනා ලංකාවට පැමිණීම. ඔවුන් දැව අරටුවක් ගෙන ක්වීලෝන් නගරයේ දේවස්ථානයක් සෑදීම සඳහා යැවීම.

**සේයා - ටී. සුනිල් ප්‍රනාන්දු**

**(තවත් කොටසක් ලබන සතියේ)**

# ඉංග්‍රීසි පාඩම
## විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 41**

## Much, Many, Little, Few

අපි යම්කිසි "ප්‍රමාණයක් ගැන" ඇඟවීමට ඉංග්‍රීසියේදී භාවිතා කෙරෙන වචන කීපයක් ගැන මීළඟට දැනුවත් වෙමු. ඒ තමයි **Much, Many, Little, Few** යනාදි වචන...

"Much" කියන්නෙ ගොඩක්, බොහෝ සෙයින්, බහුලව යනාදි අදහස් පලකෙරෙන වචනයක්.

**"Little"** කියන්නෙ ඒකෙ අනිත් පැත්ත.

**Little** කියන්නෙ ටිකක්, ඉතා ස්වල්පයක්, සුළු වශයෙන්, යන්තමට වැනි අදහස් ප්‍රකාශ වෙන වචනයක්. Little වචනයේ කුඩා (පුංචි) යන අදහසත් කියැවෙනවා.

මෙවැනි වචන තනි වශයෙන් ගත්තම ඒවල තේරුම මොකක්ද කියල ප්‍රකාශ කරන්න හරිම අමාරුයි. ඒ වචන වාක්‍යවල යෙදෙන්නෙ කොහොමද කියන එක දිහා බලල තමයි ඒ වචන වලින් ප්‍රකාශ වෙන අදහස තේරුම්ගන්න වෙන්නෙ. ඒ නිසා මේ වචන වාක්‍යවලට දාල ඒ වචනවල තේරුම අවබෝධ කරගන්න බලමු.

**Much** සහ **Little** යොදන්නෙ ගණන් කළ නොහැකි **(Uncountable Nouns)** නාම පද සමඟයි.

I don't have much time to waste.
(අයි ඩෝන්ට් හැව් මච් ටයිම් ටු වේස්ට්)
මට වැඩි වෙලාවක් නෑ නාස්ති කරන්න.

There isn't much time for the train. Please hurry up.
(දෙයා(ර්) ඉසන්ට් මච් ටයිම් ෆො(ර්) ද ට්‍රේන් ප්ලීස් හරි අප්.)
කරුණාකරල ඉක්මන් කරන්න. දුම්රියට තව වැඩි වේලාවක් නෑ.

This battery doesn't have much power.
මේ බැටරියට ඒ තරම් විශාල බලයක් නෑ.

He is very old now. He doesn't have much energy now.
ඔහු දැන් වයසයි. ඔහුට දැන් ඒ තරම් ශක්තියක් නෑ.

I don't buy any lotteries. I don't think I have much luck.
මම ලොතරැයි ගන්නෙ නෑ. මට ඒ තරම් වාසනාවක් (ලක් එකක්) තියෙනවා කියල මම හිතන්නෙ නෑ.

I have little money with me now. (අයි හැව් ලිට්ල් මනි විත් මී නව්)
මට සල්ලි කොහොමටවත් නැති තරම් කියන අදහසයි මේ වැකියෙන් කියැවෙන්නෙ.

I have little faith in his promisses.
එයාගෙ පොරොන්දු ගැන මට ඒ තරම් විශ්වාසයක් නෑ. Little faith කියන්නෙ ඉතා අඩු මට්ටමක විශ්වාසයක් කියන අදහස. (විශ්වාසයක් නැති තරම් කියන අදහස)

*මතක තියාගන්න මෙතනදී* **little** *කියන වචනෙට සමහර අවස්ථාවලදී* **a little** *කියලත් යොදනවා. නමුත්* **a little** *සහ* **little** *කියන දෙක අතරෙ ලොකු වෙනසක් තියෙනවා.*

නිකම්ම **little** යෙදුවොත් ඒක "නැහැ" කියන පැත්තට බරයි. මුළුමනින්ම නැති තරම් කියන අදහස පිළිබිඹු වෙනවා.

**a little** කිව්වොත් ඒ තරම්ම නැති බවක් කියැවෙන්නෙ නෑ. තරමක්, ටිකක්, තිබෙන බවකුයි කියැවෙන්නෙ.

I have **little knowledge** about that.
මට ඒ ගැන කිසිම දැනුමක් නෑ කියන අදහසට කිට්ටු අදහසක් ඒකෙන් කියැවෙන්නේ. ඉතාම අවම මට්ටමේ "යන්තමට වගේ" දන්නව මිසක් ඒ ගැන දන්නෙ නෑ කියන අදහස.

I have ***a* little knowledge** about that කියන්නෙ මං ඒ ගැන ටිකක් විතර දන්නවා කියන අදහස.

ඒ වගේ තව නිදසුනක්:-

අපි හිතමු මම ගෙයක් හදනව කියල. ලක්ෂ 8 ක් ඕන ඒකට මා ළඟ ලක්ෂ 5 ක් විතර තියෙනව නම් මට මෙහෙම කියන්න පුළුවන්.

I am building a house. I have **a little** money for that. But I need some more.
මම ගෙයක් හදනවා. මට සල්ලි ටිකක් තියෙනවා. ඒත් මට තව සල්ලි ඕන.

අපි හිතමු අතේ තියෙන්නෙ රු. 50,000 ක් හෝ ඊට අඩු ගානක් කියල. ගෙයක් සෑදීමට අවශ්‍ය මුදලට සාපේක්ෂව ඒ මුදල කොහෙත්ම ප්‍රමාණවත් නෑ. සල්ලි නැති තරම් කිව්වත් කමක් නෑ. අන්න ඒ අදහස තමයි ප්‍රකාශ වෙන්නෙ "a" නැතුව "little money" විතරක් යෙදුවොත්,

I want to build a house. But I have **little money.**
(මට ගෙයක් හදන්න ඕන. ඒත් සල්ලි නෑ... (නැති තරම්) යන අදහස තමයි කියැවෙන්නෙ.)

අපි ඒ වගේම Many සහ Few කියන වචනෙ “බොහෝ” සහ “ටිකක්” යන අදහස් ප්‍රකාශ කිරීමට යොදාගන්නවා.

## ප්‍රශ්න සඳහා පිළිතුරු

පහත සඳහන් වැකි වලට **some** හෝ **any** යන වචන වලින් සුදුසු පදය තෝරා ලියන්න.

1. Can you give me **some**.information about this city?
2. We didn't buy.**any**.books.
3. Tomorrow I am going on a picnic with **some** of my friends.
4. Have you seen **any** good films recently?
5. I did'nt have.**any** money. So I had to borrow **some** money from my friend.
6. Would you like to have **some** tea or coffee?
7. I was trying to do **some** work.
8. There are five buses. You can travel in.**any** bus.
9. We have to buy **something** for Amma. What shall we buy?
   Buy (1) **anything**
   Buy (2) **some** fruits.
10. If you don't understand **any** words please ask me.
11. Are there (1) **any**.words that you don't understand?
    Yes sir, there are (2) **some** words.
12. You can select **any** book you like, from this lot.
13. In the sale today. **any** shirt was Rs. 300/

**Some/ any/** හෝ එම වචන වලට එකතු කළ **+ body/ +thing/ +where** යනාදි වචන වලින් හිස්තැන් පුරවන්න

14. There is **somebody** at the door.
15. I didn't eat **anything** this morning.
16. Does **anybody** like to have a tea?
17. I am not going **anywhere** tomorrow.
18. What are you searching for? Did you lose **anything**?
19. She didn't tell me **anything**
20. He is upset about.**something**
    He doesn't speak to **anyone**
21. **someone** has torn my book.
22. There was hardly **anyone** in the road because of the rain.
23. I didn't like **anyone** in that party.
24. **Something** should be done about this problem.
25. If **somebody** phones while I am out ask them to call me in the evening.
26. Don't go alone. Go with **somebody**
27. **Anyone** can learn English if they try.
28. Where can I sit? You can sit **anywhere** in this row.
29. This medicine is available in **any** pharmacy
30. You can invite **anybody** you like to this party.

**None/Nobody/ Nothing/ Nowhere** යනාදි වචන යොදා හිස් තැන් පුරවන්න.

31. What were you doing?
    I was doing **nothing**
32. Who were you talking to?
    I was talking to **no one**
33. How much money have you got?
    I have **none**
34. How may Children have they got?
    They have got **none**
35. Whom did you meet?
    I met **nobody**
36. Where are you going?
    I am going **nowhere**
37. Today is a public holiday.
    So,**no** shops are open. (නැත්නම් **none of the shops** )
38. I couldn't cook today. Because there was **no** gas.
39. Please buy **some** eggs from the shop, if you want an omelette.
40. **None** of the photos are clear.



**මල් බඳුනක්**
ලක්ෂානි
රංගිකා
7 ශ්‍රේණිය
බප/ගම්
මද්දුම
බණ්ඩාර මහ
විද්‍යාලය



**පරිසරයේ අසිරිය**
හෂිණි අමාෂා ලෝචි
8 ශ්‍රේණිය
මහමායා බාලිකා විදුහල - මහනුවර



**අපගේ ජේසු සමිඳුන්**
දිල්ශාන් සදරුවන්
4 ශ්‍රේණිය
සා. අන්තෝනි දහම් පාසල -
දුනකදෙනිය



**දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය**
ස්වේන් දේදුනු ප්‍රශංසා
1 ශ්‍රේණිය
නිමල මරියා බාලිකා විදුහල - තුඩැල්ල

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**දිය ඇල්ලක්**
කවිඳු දෙව්මිණ
7 ශ්‍රේණිය
ස්නාපනය ලැබූ ජේසුස් වහන්සේගේ
දහම් පාසල - මුට්ටුව (නයිනමඩම මීසම)



**අපේ ගෙදර**
සමීෂා රන්ජලි
3 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය
මොරටුව



**දිව බොදුනින් සවිමත් වෙමු**
රෙබේකා වීරසිංහ
7 ශ්‍රේණිය
සියලු සාන්තුවරයන්ගේ බාලිකා
විදුහල - බොරැල්ල



**ශු. සෙබස්තියන් මුනිතුමා**
නිර්මාල් රොෂාන්ත පෙරේරා
3 ශ්‍රේණිය
ශාන්ත මයිකල් දහම් පාසල
කොරළවැල්ල

# මීගමුවේ කිතුනු පාසල් සිසුවියෝ දෙදෙනෙක් ශ්‍රී ලංකා පාසල් චෙස් පිල නියෝජනය කරමින් ජාත්‍යන්තර තරඟබිමේ

මීගමුව කඩොල්කැලේ සාන්ත ජොශප් ශාඛා පාසලේ හිමාෂා අපූර්වි පෙරේරා සිසුවිය ශ්‍රී ලංකා පිල නියෝජනය කරමින් පසුගිය ද ජාත්‍යන්තර තරඟාවලියකට එක් විය. ඒ ඉන්දියාවේ නව දිල්ලි නුවර ඉන්දිරා ගාන්ධි ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවති 07 වන ආසියා පාසල් චෙස් ශූරතාවලිය සඳහාය. මෙහිදී අපූර්වි ශ්‍රී ලංකා පිලේ වයස අවුරුදු 07 න් පහළ නිල ක්‍රීඩිකාව වශයෙන් සහභාගී වීම විශේෂත්වයකි. පුංචි සන්ධියේ පටන් චෙස් ක්‍රීඩාව සඳහාම පෑ අපූර්වීගේ අපූර්වත වූ හැකියාවන් ගැන මීට ඉහත දී ළමා ප්‍රදීපයේ විස්තර පළ වුණි. (කුමර නයනජිත් )




ඉන්දියාවේ නව දිල්ලි නුවර පැවති 2011, 07 වන ආසියානු පාසල් චෙස් ශූරතා තරඟාවලියේදී ශ්‍රී ලංකා පිලේ අවුරුදු 9 න් පහළ නිල ක්‍රීඩිකාව වශයෙන් එක්වූයේ මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ රොෂෙල් නතාෂා ඇස්කි ශිෂ්‍යාවයි. ඇයට උපහාර පිදීමේ උත්සවයක් පාසලේ දී පසුගියද පැවැත්වුණි. නතාෂා ශිෂ්‍යාව

විදුහල්පතිනි ගරු ෆැන්සීන් මුතුගල පැවිදි සොහොයුරිය විසින් මල් කළඹක් දී පිළිගත් අයුරු මෙහි දිස්වේ. (ඩබ්ලිව්. හියුබට් ප්‍රනාන්දු - මීගමුව )



# කොළොන්නාව සා. ජෝශප් දෙව්මැඳුරේ ජේසු බිළිඳු ධර්මදූත ළමා සමාජය විසි වසර සපුරයි



පසුගියදා පැවති ධර්මදූත ළමා සමාජයේ විසිපස්වන සංවත්සරය නිමිත්තෙන් කොළොන්නාව සා. ජෝශප් දේවස්ථානයේ ජේසු බිළිඳු ධර්මදූත ළමා සමාජයේ දරු දැරියන් විසින් එදින සැමරුම් දිව්‍ය පූජාව සංවිධානය කළ අතර, එහිදී විසි වසරකට පෙර මීසම තුළ ධ.ළ.ස. ආරම්භ කළ පැවිදි සොයුරිය වන ගරු මේරි එලෝඩි (ය.එ.) පැවිදි සොයුරියට උපහාර පිදීමක් ද සිදුකෙරිණි.

මීසම් සේවක ගරු රුවන් රීඩ් ලියනගේ පියතුමන්ගේ මඟ පෙන්වීමෙන් සහ මීසමේ ධ.ළ.ස. දරු දැරියන්, දෙමාපියන් සමඟ සජීවිකාවන් එක්ව මෙය සංවිධානය කෙරිණි. දිව්‍ය පූජාවෙන් පසුව පැවිදි සොයුරිය සමඟ දරු දැරියන් සහ ආරම්භක සජීවිකාවන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. (ක්‍රිෂාන්ති පෙරේරා)

# වාර්ෂික දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සව



මොරටුව කටුකුරුන්ද ශා. මරියා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගිය ද කටුකුරුන්ද දහම් පාසල් ප්‍රධාන ශාලාවේදි පැවැත්වුණි. මොරටුව ශා. සෙබස්තියන් විදුහලේ ප්‍රාථමික අංශයේ විදුහල්පති ගරු දයා දර්ශන පියතුමාගේ ප්‍රධානත්වයෙන් කටුකුරුන්ද මීසම්පති ගරු ක්‍රිශාන්තස් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමාගේ සහභාගිත්වයෙන් ලැවති මෙය දහම් ගුරු කැල එක්ව සංවිධානය කළහ. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. (අසික ප්‍රියදර්ශන)

වයික්කාල සා. බෙනඩික් දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය හා විවිධ ප්‍රසංගය පසුගියද සා. බෙනඩික් දෙව් මැදුරු භූමියේ දී මීසම් පාලක ගරු ලක්සිරි ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙදින ප්‍රසංගයේ අවස්ථාවක් සේයාවෙහි දිස්වේ.

(එච්.ඒ සිරිල් පෙරේරා)





ජා - ඇල වික්ෂෝපමාතා දේවස්ථානය අසල පිහිටි ''ෂෙරිනා'' ජාත්‍යන්තර පෙර පාසලේ විවිධප්‍රසංගය පසුගිය දා පැවැත්වුණි. ජා - ඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේවස්ථානයේ දහම් පාසල් ශාලාවේදී පැවති මෙයට පෙරපාසල් ප්‍රධානි ඇන් මහත්මියද සහභාගී වුනි. මෙදින කුඩා දරුවන් ඉදිරිපත් කල විශේෂාංගයක් මෙහි දිස්වේ.

(නිශාන්ත රෝසා)



බම්බලපිටිය ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ 2011 වසරේ උසස් පෙළ හදැරු එල්.ඩී. ගයනි තරුෂිකා චිත්‍ර නිර්මාණ අංශයෙන් සුවිශේෂී දස්කම් දක්වන සිසුවියකි. වසරින් වසර විවිධ තිළිණයන් හිමි කරගත් අතර 2010 පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ජ්‍යෙෂ්ඨ චිත්‍ර ශිල්පී සම්මානයද 2010 බස්නාහිර පළාත් ළමා චිත්‍ර තරඟාවලියේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික තෙවන ස්ථානයද හිමිකර ගත් අතර, 2011 වසරේ දී කඩුවෙල මහනගර සභාව මෙහෙයවූ විවෘත සාහිත්‍ය තරඟාවලියේ චිත්‍ර තරගයෙන් ජ්‍යෙෂ්ඨ ද්විතියක අංශයේ දෙවන ස්ථානය දිනාගැනීමට සමත් විය.

ගයනි තරුෂිකා සිසුවිය වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයේ 'සුනිමල' දහම් පාසැලේ ද දිදුලන සිසුවියකි. පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවයකදී චිත්‍ර අංශය සඳහා තිළිණයක් ලබාගත් අයුරු. (එම්.ජෝ.පාරිස්)

## ධර්මදූත ළමා සමාජිකයිනට මෙන්න අනගි අවස්ථාවක් !

**ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25වෙනි සංවත්සරය නිමිති කරගෙන නිර්මාණය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත තැටියට ගීත රචනා කිරීමට ධර්මදූත ළමා සමාජ ළමුන්ට හා සජීවක සජීවිකාවන්ට කෙරෙන සුහද ආරාධනයයි !**

**තේමාව : "දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා මිනිස් වටිනාකම් ඉස්මතු කෙරෙන ගීතයන්"**

**පුන ගැයිය : (Chorus) සහ**

**ගැයිය දෙකක් (2 verses)**

**ඔබගේ නිර්මාණය සමඟ පහත කූපනයද පුරවා 2012 පෙබරවාරි මස 29 වෙනිදාට පෙර අප වෙත එවන්න.**

නම:- ..........................................................................

ලිපිනය :- ..................................................................

ධර්මදූත ළමා සමාජ
ඒකකයේ නම :- ...........................................................

මීසම :- ......................................................................

පදවිය :- .....................................................................

මීසම් භාර පියතුමාගේ නම,
අත්සන හා නිලමුද්‍රාව :- ...............................................

**අපගේ ලිපිනය :**
**ජාතික අධ්‍යක්ෂ පියතුමා**
**ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය**
**නො : 19, බැල්කම් පෙදෙස,**
**කොළඹ - 08.**
**දුරකථන අංකය : 011-2685673**

## ප්‍රහේළිකා අංක 28



### හරහට

1. ක්‍රිස්තුස් වහන්සේ බව්තිස්ම ස්නාපනය ලැබුවේ මෙම ගඟේදීය.
3. මෙය, දකුණතින් දෙන විට වමතට නොදැනෙන ලෙස දිය යුතු බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.
4. පොරොන්දු දේශය කරා යන ගමනේ දී, ඊශ්‍රායෙල් ජනතාව රතුමුහුද .............. කළෝය. මෙහි හිස්තැනට සුදුසු වචනය .
6. මනුෂ්‍යයෙකුගේ කතාවෙන් ඔහුගේ අඩුලුහුඩුකම් හෙළිවන්නේ, පිට මෙසේ කරන විට පොණෙරයෙහි රොඩු ඉතුරු වන ලෙස උපදේශනය හෙවත් සිරාක් පවසයි.
7. ........... වනිතාව සිය පවුල ගොඩනගන්නීය. යනුවෙන් හිතෝපදේශය පොතේ සදහාන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

### පහළට

1. සාවුල් රජතුමාගේ පුතාගේ නම.
2. මෝසෙස්, ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ අණ පනත් ගැන පහදා දෙමින් රූප ........... නො කරන ලෙස ප්‍රකාශ කළේය. මෙහි හිස්තැනට සුදුසු වචනය.
5. දෙවියන් වහන්සේ මිස අන් කිසිවෙකු මෙසේ නොවේයැයි ක්‍රිස්තුන් වහන්සේ එක් ධනවත් ප්‍රධානියෙකුට වදාළ සේක.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 1, ශු. මතෙව් 6, උපදේශකයා හෙවත් සිරාක් 27, හිතතෝපදේශය 14, ද්විතිය නිති සංග්‍රහය 4/ 15, සමුවෙල් 19, ශු. ලුක් 18)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 28, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා පදීපය ඔබ වෙත රැගෙන එයි

පස්වන කොටස

සැකසුම : තිළිණ අලුහකෝන්

# දිවැසිවර ජෝනා

